ලංකාවේ ඉංජිනේරු අධ්‍යාපනය මා දන්නා තරමින් ආරම්භයේ සිට දිගටම සිදුකෙරුණේ ඉංග්‍රීසි බසිනි. මෙය කවර අවදියක හෝ සිංහලෙන් හෝ දෙමළෙන් සිදුවූ බවක් මා දන්නේ නැත. සිංහලෙන් හෝ දෙමළෙන් වසර දොළහක පාසැල් අධ්‍යාපනය නිමකර සරසවියට ඇතුළු වන ඉංජිනේරු සිසුවකුට මෙසේ එක්වරම සිදුවන සංක්‍රාන්තිය සැලකිය යුතු අභියෝගයකි. මහා ලොකු ඉංග්‍රීසි දැනුමක් නොතිබුණත් සරසවියකට ඇතුළු වන විට රජයේ ඉංග්‍රීසි උපගුරුවරයෙකු ලෙස සේවය කරමින් සිටි මටද මේ සංක්‍රාන්තිය විශාල අභියෝගයක් වීනම්, හරියකට ඉංග්‍රීසි ගුරුවරයෙකු හෝ නොසිටි පාසැල් වලින් පැමිණි සිසුන් මුහුණ දුන් අභියෝගයේ තරම සිතාගැනීම අපහසු නැත.

ඉහත තත්ත්වයට යම් විසඳුමක් ලෙස ඉංජිනේරු විද්‍යා දේශන ආරම්භ කිරීමට පෙර මාස කිහිපයක ඉංග්‍රීසි පුහුණුවක් සිදු කෙරුණේය. සරසවි දොරවල් ඇරී තිබෙනවාට වඩා වැසී තිබුණු, මා සරසවි පිවිසුම් ලබා සිටි සමයේ මේ පුහුණුවේ මුල් කොටස සරසවි වලින් පිටතදීත් දෙවන කොටස සරසවි තුළත් සිදු කෙරුණේය. මුල් කොටස සාමාන්‍ය ඉංග්‍රීසි පුහුණුවක් වූ අතර මෙය විවිධ විෂයයන් හදාරන සිසුන්ට පොදුවේ ඒ ඒ දිස්ත්‍රික්ක වලම පැවැත්වුණු අතර දෙවන කොටසින් ආවරණය කෙරුණේ ඉංජිනේරු විද්‍යා (හෝ පීඨය අනුව තමන් හැදෑරූ වෙනත්) විෂයයන් ඉගෙනීමට අවශ්‍ය වන ඉංග්‍රීසි දැනුමයි.

මේ ඉංග්‍රීසි පන්ති පැවැත්වුණේ කුඩා කණ්ඩායම් වශයෙනි. මේ අනුව, අපට මුලින්ම අඳුනා ගැනීමට ලැබුණු සරසවි සගයන් වූයේ තමන් ඇතුලත්ව සිටි ඉංග්‍රීසි පන්තියට සහභාගී වූ සිසුන්ය. එමෙන්ම, පේරාදෙණියේ අපේ කාණ්ඩයේ සිසුන්ගේ පළමු ගුරුවරයා වූයේ මෙසේ ඉංග්‍රීසි ඉගැන්වූ යම් අයෙකි. මගේ කණ්ඩායමට මෙසේ ඉංග්‍රීසි ඉගැන්වූ ගුරුවරිය මහාලිංගම් මහත්මියයි. ගුණවර්ධන

දෙනු ගැනත් කියන්නට තිබුණු රසවත් කතා හිල්ඩා ශාලාවේ තෙවන මහලේ සඳළුතල*කොරිඩෝවේ ඈඳිගෙන, මැදියම් රැයද පසුවනතුරු කට ඇරගෙන අසා සිටීම කිසිසේත්ම වෙහෙසකර කටයුත්තක් නොවීය. ඔහුගේ ඇතැම් පාසැල් සගයින් ඉංජිනේරු පීඨයේ අපට වඩා ජ්‍යෙෂ්ඨ කණ්ඩායම් වල සිටි බැවින් පීඨය පිලිබඳ නො දන්නා බොහෝ දේ මා මුලින්ම දැනගත්තේ ඔහුගෙනි. මේ අනුව, අපේ ඉංග්‍රීසි ගුරුවරියන් වූ මහාලිංගම් මහත්මියගේත්, ගුණවර්ධන මහත්මියගේත් සැමියන් ඉංජිනේරු පීඨයේ මහාචාර්යවරුන් බවත්, "සිරා පොරවල්" බවත් මා මුලින්ම දැනගත්තේ අබරන්ගෙනි.

කාලය වේගයෙන් ගෙවී ගියේය. ඉංග්‍රීසි මධුසමය අවසන් වී ඉංජිනේරු විද්‍යා පාඨමාලා සමග ගෙවන සැබෑ කම්මල් ජීවිතය අපේ ජීවිත හිර කර අගුළු ලුයේය. මේ වන විට මා හඳුනාගෙන සිටි අපේ තවත් බැචෙක් වූ අණ්ඩරයා (නැවතත්, සැබෑ කාඩ් එක නොවේ.) ඔහුගේ ගොන්පාට් වලින් අපේ ඒකාකාරී ජීවිත වල නීරස තරමක් නොව බොහෝ දුරට අඩු කළේය. මහාලිංගම් මහත්මියගේ සැමියා වූ මහාචාර්ය මහාලිංගම්වද මේ වන විට අපි හඳුනාගෙන සිටියෙමු.

අපේ කාලයේදී යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශයේ අධිපති වූයේ මහාචාර්ය මහාලිංගම්ය. පැසුණු හිසෙන් යුතු, සුදුවතින් සැරසුණු මේ උත්තුංග දේහධාරියා පෞරුෂයේ සංකේතයක් බඳුවිය. එවකට විදුලි සහ විද්‍යුත් ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශයේ අධිපති වූයේ මහාචාර්ය ජයසේ කරයි. මහාචාර්ය මහාලිංගම් මෙන් උසමහත පුද්ගලයෙකු නොවූවත් ඔහුද බොහෝ විට සුදුවතින් සැරසුණු ප්‍රසන්න පුද්ගලයෙකි. මහාචාර්ය මහාලිංගම්ගේ විෂය ක්ෂේත්‍රය කම්පනය සහ අනුනාදය හා අදාල වූ අතර මහාචාර්ය ජයසේකර ඉගැන්වූයේ විද්‍යුත් චුම්භක ක්ෂේත්‍ර පිලිබඳවය.

මේ කාලයේ බොහෝ දිනවල හවස් වරුවේ මහාචාර්ය මහාලිංගම්, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා අධ්‍යයන



# මහා විද්වතකු පිළිබඳ මතකය

## වරදාන ප්‍රතික්ෂේප කර විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් ජෙට් එන්ජිමක් ඉල්ලූ ආදර්ශමත් විද්වතා මහාචාර්ය මහාලිංගම් පිළිබඳ සටහනකි

මහත්මිය මෙවැනි තවත් ඉංග්‍රීසි ගුරුවරියක් විය.

දිවා කාලයේදී ඉංග්‍රීසි පන්තියේ එකට සිටි බැචාලාව අඳුනා ගන්නා අතර රාත්‍රී කාලයේදී ශිෂ්‍ය නේවාසිකාගාරයේ නැවතී සිටි වෙනත් බැචාලාද හඳුනාගන්නට ලැබුණේ නවකවද අත්දැකීම්ද සමග කලවමේය. වලස්මුල්ල පැත්තෙන් පැමිණි අබරන් (සැබෑ කාඩ්එක නොවේ) ඇතුළු මගේම බැචාලා කිහිපදෙනෙකු මුල්සතියේම මට හඳුන්වා දුන්නේ ඒ ප්‍රදේශයෙන්ම පැමිණි ජ්‍යේෂ්ඨ උත්තමයෙකි. ඉහත සඳහන් කළ මගේ බැචාලාට දිනපතා සවසට ඉංග්‍රීසි පන්තියක් පවත්වන ලෙස මේ ජ්‍යේෂ්ඨ උත්තමයා මට නියෝග කළේ නවකවදයේ කොටසක් වශයෙන්ම නොව, එයින් ඉහත සිසුන්ට යම් පිටිවහලක් ලැබේයැයි අවංකවම අදහස් කරමින් විය යුතුය. කෙසේ වුවද, මේ හේතුවෙන් අබරන් මුල් කාලයේම මගේ මිතුරෙක් විය.

ඉංග්‍රීසි දැනුම අතින් පිටුපසින් සිටියත් අබරන් නොදන්නා මගුලක් නැත. තුන්වන උත්සාහයෙන් සරසවි පැමිණ සිටි මට වඩා වසර කිහිපයක් වැඩිමලෙකු වූ ඔහුට භීෂණ සමයේ සිදුවීම් ගැනත්, කාන්තා පාර්ශ්වය සමග සිදු කළ ගණු-

අංශයේ සිට කොරිඩෝව දිගේ දිගු පියවර තබමින් විද්‍යුත් ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ජයසේකරගේ කාර්යාලය වෙත ඇවිද ගොස් දිගු වේලාවක් සාමිචියේ යෙදීම විශේෂ සැලකිල්ලක් නොදැක්වූ සිසුවෙකුට වුවද හොඳින් නිරීක්ෂණය වන දසුනක් විය.




සාමාන්‍ය ආචාර්ය උපාධියකට වඩා ඉහළ උපාධියක් ලෙස සැලකෙන, තම ක්ෂේත්‍රය වෙනුවෙන් සැලකියයුතු කාර්යභාරයක් සිදුකළ අයෙකුට පිරිනැමෙන, ඩීඑස්සී ගෞරව උපාධියක් ලබාගත් ඉංජිනේරු විද්‍යා ක්ෂේත්‍රයේ ලංකාවේ පළමුවැන්නා මහාචාර්ය මහාලිංගම් බව එවකට අපි දැන සිටියෙමු. එමෙන්ම, ඇව්රෝ ජෙට් එන්ජිමෙහි වූ කිසිවෙකුට සොයාගත නොහැකි වූ දෝෂයක් ඔහු විසින් සොයාගත් බවත්, ඒ වෙනුවෙන් ලැබුණු බොහෝ වරදානයන් ප්‍රතික්ෂේප කර, පේරාදෙණිය ඉංජිනේරු පීඨයේ ඉදිරිපස ප්‍රදර්ශනය කර ඇති රොකට් එන්ජිම පමණක් ඔහු ඉල්ලා සිටි බවත් වැනි දේ මේ වෙද්දී අපි අසා සිටියෙමු.

මේ දිනයේදීත් මහාචාර්ය මහාලිංගම් කොරිඩෝව දිගේ ඇවිද යන්නේ මහාචාර්ය ජයසේකර හමු වීමට විය යුතුය.

"මචං, ඔය ප්‍රොෆෙසර් මහලිංගම් හැමදාම හවසට හවසට ප්‍රොෆෙසර් ජයසේකර හම්බ වෙන්න යන්නෙ ඇයි කියල දන්නවද?"

අබරන් තවත් බැචාලා කිහිප දෙනෙකුට කියනු ඇසී මාද ඔලුව දැම්මේ ඔහුගේ කතා සාමාන්‍යයෙන් රසවත් නිසාය. ඒ වගේම, ඔහු නොදන්නා ඕපාදූපයක් නැත.

"පොර අලුතින් තියරියක් හොයාගෙන ප්‍රොෆෙසර් ජයසේකරත් එක්ක. වයර් නැතුව වයිබ්‍රේෂන් යූස් කරලා ඉලෙක්ට්‍රිසිටි ට්‍රාන්ස්මිට් කරන්න."

"අනේ පලයන් බන් යන්න"
"නෑ මචං, සිරාවට" මෙසේ කියමින් ඔහු පැත්තක සිටි අණ්ඩරයා දෙස බැලුවේ සිය මතය තහවුරු කිරීමට උදවුවක් බලාපොරොත්තුවෙන් මෙනි.

48 පිටට

ALL NATURAL INGREDIENTS
MADE IN AUSTRALIA
COGINT HERBAL INFUSION
Each Sachet makes 2 to 3 Drinks
Take at the first sign of a sore throat or cold
කැස්ස සහ සෙම්ප්‍රතිශ්‍යාවට ප්‍රථම සහනය
ඕස්ට්‍රේලියාවේ නිපදවූ ඉඟුරු කොත්තමල්ලි පානය
Get nutrients to BOOST your immune system and fight colds and flu.
ORDER ONLINE
www.cogint.com.au
/cogint

RESIDENTIAL DESIGNS, PLANS & PERMITS
RANJITH WANNINAYAKE
B.Sc(BE),M.Sc(Arch),AIA(SL),Dip Ineterior(NSW)
Registered Building Practitioner DP-AD 43423
Member of the Building Designers Association of Victoria 3862
Chartered Architect (SL) A0476
20years exp.
- FREE ADVICES
- PLANS–SINGLE/DOUBLE STOREY/ EXTENSIONS/DECKS/CARPORTS
- PLANNING PERMIT DRAWINGS
- BUILDING PERMIT DRAWINGS
- CORDINATING OTHER CONSULTANTS WORK
REGISTERED Building Practitioner
bdav
3/19 Balmain Court, Lalor 3075
Tel: 0430 066 241 Email: designrake@gmail.com